# මනස පිළිබඳ සිංහල බෞද්ධ විග්‍රහය විඥානවාදී ද?

(සුමේධ වීරවර්ධන, සහකාර කථිකාචාර්ය, දර්ශන හා මනෝවිද්‍යා අංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය.)

මේ කෙටි ලිපියේ අරමුණ වන්නේ, මනස පිළිබඳ සිංහල බෞද්ධ විග්‍රහයේ ස්වභාවය, විඥානවාදයේ ස්වභාවය, මනස පිළිබඳ සිංහල බෞද්ධ විග්‍රහයේ දැක්වෙන විග්‍රහය විඥානවාදී ද යන්න සහ සිංහල බුදු සමය තුළ මනස ප්‍රධාන වන්නේ කුමන අරුතින් ද යන්න විමසා බැලීම ය. මේ ලිපියේ මාතෘකාවේ දැක්වෙන 'සිංහල බෞද්ධ' යන යෙදුමට ඇතමුන් එකඟ නොවීමට ඉඩ ඇත. එහෙත් ඒ සම්බන්ධයෙන් කීමට ඇත්තේ මනස හෝ වෙනත් ඕනෑ ම දෙයක් පිළිබඳ ව හුදු බෞද්ධ විග්‍රහයක් කොතැනකවත් තිබිය නොහැකි බව ය. කුමක්නිසා ද යත් ස්වෝස්තිවාදී යෝගාචාර විඥානවාදී ආදී විවිධ බෞද්ධ ගුරුකුල තිබීම සහ ඒවා මගින් විවිධ පරස්පර විග්‍රහයන් (එක ම සංකල්ප ගැන) ඉදිරිපත් කර තිබෙන බැවිණි. බුදුදහම විවිධ රටවල්වලට පැතිර යාමේ දී ඒ ඒ රටවල්වල සංස්කෘතීන් සමඟ මුසුවීම නිසා විවිධ බෞද්ධ සම්ප්‍රදායයන් බිහි විය. ඒ අනුව මෙරට බිහි වූ සම්ප්‍රදාය ය වන්නේ සිංහල බෞද්ධ සම්ප්‍රදාය යි. ඈත අතීතයේ සිටම ලක්දිව හැඳින්වීම, සඳහා යෙදුණු පර්යාය නාමයක් වන්නේ **'සිංහලේ'** යන්න ය. චීන සංස්කෘතිය සමඟ මුසු වූ බුදු සමය චීන බුදුසමය වූවාක් මෙන් **'සිංහලේ'** සංස්කෘතිකාංගවලින් පෝෂණය වී, මෙරට සිවුවනක් පිරිස විසින් මහත් වීර්යයෙන් රැකගත් බෞද්ධ සම්ප්‍රදායය වන්නේ සිංහල බෞද්ධ සම්ප්‍රදාය යි. මහායාන බුදුසමය හා හින්දුදහම වැනි අන්‍ය දහම්වලින් යම් යම් දේ ලබාගෙන ඇතත් බුදුසමයේ හරය, සිංහල බෞද්ධ සම්ප්‍රදායය මගින් රැක ගෙන ඇත. අවශ්‍ය නම් සිංහල බුදුසමයට **'මහාවිහාරීය ථෙරවාද සම්ප්‍රදාය'** යනුවෙන් පැවසීමේ ද වරදක් නැත. කෙසේ වුවත් මෙහි දී අපගේ අවධානය යොමුවන්නේ සිංහල බුදුසමයේ හෙවත් මහාවිහාරීය ථෙරවාද සම්ප්‍රදායයේ දැක්වෙන මනස පිළිබඳ විග්‍රහය විඥානවාදී ස්වරූපයක් දරන්නේ ද යන්න විමසා බැලීම ය.

**'විඥානවාදය'** යන්නෙන් අදහස් කරන්නේ 'මනස' පරමාර්ථ වශයෙන් පවතින බවත්, ද්‍රව්‍යමය ලෝකය මනසේ නිර්මාණයක් හෙවත් මනඃකල්පිතයක් බවත් ය. මනස, ද්‍රව්‍යයට වඩා ප්‍රධාන වන බවක් විඥානවාදයේ කියැවේ.

මීළඟට මනස පිළිබඳ සිංහල බෞද්ධ විවරණයේ ස්වභාවය විමසා බලමු. සංයුක්ත නිකායේ, අස්සුතවන්තු සූත්‍රයේ දැක්වෙන පරිදි මනස මෙන් ම ද්‍රව්‍යය ද අනිත්‍ය ය. කයේ සහ මනසේ අනිත්‍යතාව තුලනාත්මක ව එහි දක්වා ඇත. එහි දැක්වෙන පරිදි ද්‍රව්‍ය ගරු පරිණාමී වන අතර මනස ලහු පරිණාමී වේ. එම සූත්‍රයේ දැක්වෙන පහත පාඨයෙන් ඒ බව පැහැදිලි වේ.

''..... මෙකී කය ආත්ම වශයෙන් ගැණීම මැනවි. මක්නිසාද යත්, මෙම චාතුර්මහාභූතික කය, වසරක්, දෙකක්, තුනක්, හතරක්, පහක්, දහයක්, විස්සක්, තිහක්, හතලිහක්, පණහක්, සියයක් හෝ

ඊට වැඩි වසර ගණනක් හෝ පවතිනු දැකිය හැකි ය. එහෙත් මහණෙනි, යමක් සිත, මනස, විඥ්ඥාණ යැයි කියනු ලැබේ ද එය රෑ දහවල් දෙක්හි අනෙකක් ම උපදී. අනෙකක්ම නිරුද්ධ වේ. කෙසේ ද යත් මහ වනෙහි හැසිරෙන වඳුරෙක් ගසක එක අත්තක් අල්වාගෙන අනික් අත්ත අතහරින්නාක් මෙනි''

සිතට වඩා වැඩි කාලයක් කය පවතින බව කියැවෙන මෙම අදහස පසුකාලීන ආභිධාර්මික විවරණ තුළ දැක්වෙන්නේ රූපක්ෂණයක් ඇති ව නැති වී යන කාලය තුළ චිත්තක්ෂණ දාහතක් ඇති ව නැති වී යන බව යි.

මේ අනුව පැහැදිලි වන්නේ සිංහල බුදුසමය තුළ පරමාර්ථ වශයෙන් පවතින, හෙවත් අවිනාශී මනසක් ගැන නොකියැවෙන බව යි. බුදුසමය අනාත්මවාදී දහමකි. එබැවින් ශාස්වතවාදය සහ උච්ඡේදවාදය යන ආත්මවාදී ස්ථාවර දෙකම බුදුසමය බැහැර කර ඇත. භවයෙන් භවයට ගමන් කරන මනසක පැවැත්ම පිළිගන්නේ නම් එය ශාස්වතවාදී වේ. මේ ආත්මය තුළ තිබී මරණයේ දී නැති වී යන මනසක් ඇතැයි ගැනීම උච්ඡේදවාදී වේ.

මනස පිළිබඳ සිංහල බෞද්ධ සම්ප්‍රදායය තුළ දක්නට ලැබෙන විවරණයේ ස්වභාවය පිළිබඳ ව පැහැදිලි වන වැදගත් අවස්ථාවක් මජ්ඣිම නිකායයේ, මහාතණ්හාසංඛය සූත්‍රයේ සඳහන් වේ. බුදුරජාණන්සේ ජීවමාන ව වැඩසිටි සමයේ සිටි සාති හිමි විසින් මනස පිළිබඳ ව ශාස්වතවාදී ස්ථාවරයක් දරනු ලැබ ඇති බව පෙනේ. මනස, භවයෙන් භවයට ගමන් කරන බව ඒ හිමියන් පිළිගෙන ඇති අතර එය බුදුරදුන්ගේ දේශනාව ලෙසත් වරදවා ප්‍රකාශ කර ඇත. සාති හිමිගේ ඒ ශාස්වතවාදී දෘෂ්ටිය, මිථ්‍යා දෘෂ්ටියක් බවත්, ඒ හිමියන්ට බුදුදහමේ උණුසමවත් ලැබී නැති බවක්, තමන් වහන්සේ විසිනුත් දේශිත යැයි වරදවා පවසන මෙම මිථ්‍යා දෘෂ්ටිය සාති හිමිට දුක් පිණිස පවතින බවත් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනු ලැබ ඇත.

මේ අනුව පැහැදිලි වන්නේ සිංහල බුදුසමය තුළ පරමාර්ථ වශයෙන් පවතින මනසක් පිළිබඳ ව නොකියැවෙන බවත්, හේතු ප්‍රත්‍යය සමවායෙන් හට ගන්නා වූ සංඛත ධර්මයක් වූ චිත්ත පරම්පරාවක් ගැන එහි කියැවෙන බවත් ය. එසේ ඇති ව නැති ව යන චිත්ත පරම්පරාව තුළ ආත්ම වශයෙන් (පරමාර්ථ වශයෙන්) ගත හැකි කිසිවක් පිළිබඳ ව බුදු දහමේ සඳහන් නොවේ.

එහෙත් බුදුසමය තුළ **'මනෝ පුබ්බංගමා ධම්මා මනෝ සෙට්ඨා මනෝමයා', චිත්තේන නීයති ලෝකෝ, චිත්තේන පරිකස්සති,** වැනි පාඨවලින් පැහැදිලි වන්නේ මනසට වැදගත් තැනක් සිංහල බුදුසමය තුළ ද හිමි වන බවය. බොහෝ අය සිංහල බුදුසමය විඥ්ඥාණවාදයක් ලෙස හඳුන්වන්නේ මෙවැනි යෙදුම් පාදක කර ගෙන ය. බුදුසමය අනුව මනස ද ඉන්ද්‍රියයකි. ඇස ආදී අනෙකුත් පසිඳුරන් ට වඩා වැඩි වැදගත්කමක් මනසට ලැබේ. මක්නිසා ද යත් මනස නොමැති ව අරමුණු හඳුනාගත නොහැකි බැවිණි. නිදසුනක් වශයෙන්, ඇස නම් ඉන්ද්‍රියයට මනින්ද්‍රියයේ දායකත්වයෙන් තොර ව රූපාරම්මණයක් හඳුනාගත නොහැකි ය. අනෙකුත් ඉන්ද්‍රියයන් හතරට ද එසේ ය. මේ අනුව සංකල්ප, ප්‍රවාද සහ චිත්තරූප ආදියෙන් යුතු සම්මුති ඥානය නිර්මාණය කිරීමේ දී මනස ප්‍රධාන වෙයි. දැනුම නිර්මාණය කිරීමේ දී මනසට ලැබෙන ප්‍රධානත්වය පිළිබඳ ව අවබෝධයක් ලබා ගත

හැකි අවස්ථාවක් සංයුත්ත නිකායයේ, ආසිවිස සූත්‍රයේ සඳහන් වන බව හැගොඩ ඛේමානන්ද හිමියෝ පෙන්වා දෙති. එහි දැක්වෙන පරිදි එක්තරා නගරයකට ඇතුලු වීමට දොරටු හයක් ඇත. ඒ දොරටු හයෙන් විවිධ පෙදෙස්වලින් එන දූතයෝ නගරයට ඇතුලු වෙති. නගර මධ්‍යයයේ නගරාධිපතියා සිටියි. දූතයෝ, දොරටුවලින් ඇතුළු වී නගරාධිපතියා හමු වී තම කාර්යයන් ඉටු කර ගනිති. මෙහි දී දොරටු හය වන්නේ ඇස, කණ, දිව, නාසය, ශරීරය හා මනස යන ඉන්ද්‍රියයන් හය වන අතර දූතයන් වන්නේ ෂඩ්විධ ආරම්මණයන් ය. නගරාධිපතියා වන්නේ මනස යි. මනස මෙහි දී දොරටුවක් (ඉන්ද්‍රියයක්) ලෙසත්, නගරාධිපතියා ලෙසත් ද්විත්ව කාර්යයක නියැලෙයි. මනස ප්‍රධාන වන්නේ එහෙයිනි.

දැනුම නිර්මාණය කිරීමේ දී වෙනත් ඉන්ද්‍රියයන්ට මනසේ දායකත්වය අත්‍යාවශ්‍යම වුවත් මනින්ද්‍රියට ඒ කාර්යයේ දී ඒ වෙනත් ඉන්ද්‍රියයක සහාය අනවශ්‍යය අවස්ථා ද ඇත. මනස වෙනත් ඉන්ද්‍රියයන් සමඟ එක් වී නිර්මාණය කරනු ලබන සංකල්ප සංයුක්ත, සංකල්ප ලෙසත්, මනස විසින් වෙනත් ඉන්ද්‍රියයන්ගේ සහායකින් තොරව නිර්මාණය කරනු ලබන සංකල්ප වියුක්ත සංකල්ප ලෙසත් මහාචාර්ය නලින් ද සිල්වා මහතා විසින් හඳුන්වනු ලැබ ඇත. **'නෙළුම් මල'** නම් සංකල්පය සංයුක්ත සංකල්පයකට නිදසුනක් වන අතර **'සර්වබලධාරී දෙවියන් වහන්සේ'** නම් සංකල්පය වියුක්ත සංකල්පයකට නිදසුනකි. මේ ලිපියේ එන බොහෝ විග්‍රහයන් **'නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ'** එන සංකල්ප වෙයි. ඒ මතවාදයේ නිර්මාතෘවරයා වන මහාචාර්ය නලින් ද සිල්වා මහතාගේ පහත ප්‍රකාශයෙන් සිංහල බුදුසමය තුළ මනසට ලැබෙන තත්වය පැහැදිලි වේ.

**''සිංහල බෞද්ධ මතයට අනුව මනස ද නොපවති යි. මනස ප්‍රධාන ධර්මය වන්නේ අන් සියලු ධර්ම මනස විසින් නිර්මාණය කරන බැවින් පමණක් නොවේ. ඒ එක් ධර්මයකටවත් ඒ ධර්මය විසින්ම නිර්මාණය කිරීමට නොහැකි බැවින් ය. මනස හැරෙන්නට වෙනත් ඕනෑම ධර්මයක් නිර්මාණය කෙරෙන්නේ මනසේ ආධාරයෙනි. එහෙත් මනස එසේ නොවේ. මනස නිර්මාණය කෙරෙන්නේ වෙනත් ධර්මයක් ආධාර කර ගනිමින් නොවේ. මනස ද නිර්මාණයක් වෙයි. එහෙත් එය නිර්මාණය කෙරෙන්නේ මනස විසින් ම ය.''**

මෙතෙක් අප විසින් කරන ලද සාකච්ඡාවෙන් පැහැදිලි වන්නේ සිංහල බුදුසමය විඥානවාදී ස්ථාවරයක් නොදරන බවත්, එහි මනස ප්‍රධාන වන්නේ වෙනත් අර්ථයකින් බවත්, ඒ නිසා සිංහල බුදුසමයේ මනස පිළිබඳ විග්‍රහය විඥානවාදී යැයි අර්ථ දැක්විය නොහැකි බවත් ය.

## ආශ්‍රිත මූලාශ්‍ර


1. **සංයුක්ත නිකාය, ද්විතීය භාගය (බු.ජ.මු. - 14)** (පරි. සංයුක්ත නිකාය සංශෝධක මණ්ඩලය), ශ්‍රී ලංකාණ්ඩුවේ ප්‍රකාශනයකි. කොළඹ, 2505/1962, 148 - 151 පිටු.
2. **මජ්ඣිම නිකාය, ප්‍රථම භාගය, (බු.ජ.මු.)** 10 (පරි. මජ්ඣිම නිකාය සංශෝධක මණ්ඩලය) ලංකාණ්ඩුවේ ප්‍රකාශනයකි. කොළඹ, 2505/1964, 602-632 පිටු.
3. ඛේමානන්ද හිමි, හැගොඩ, **ථෙරවාද න්‍යාය**, කර්තෘ ප්‍රකාශනයකි. 1962 (දෙවැනි මුද්‍රණය) 53 පි.
4. ද සිල්වා නලින්, **මනස හා ද්‍රව්‍යය**, විදුසර, උපාලි පුවත්පත් ප්‍රකාශකයෝ, කොළඹ 13, 2004.02.05 වැනි බදාදා 09 පි.


**(මේ ලිපිය පාණදුරේ; වෑකඩ බෞද්ධ සහෝදර සමිතිය මගින් ප්‍රකාශිත ''වෙසක් හඬ'' (2551-2007) කලාපයේ පළ විය.)**